සමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා භාෂාවට කළ හැකි බලපෑමත්, එනිසා ශිෂ්ට සම්පන්න භාෂාවක් සමාජගත කිරීම උදෙසා මාධ්‍ය අත ඇති වගකීමත් සම්බන්ධයෙන් අපි නිරන්තරයෙන්ම පෙන්වා දී ඇත්තෙමු. කොවිඩ්-19 වසංගතය පවතින මේ මොහොතේ කොවිඩ්-19 ආසාදිතයන් කෙරෙහි සමාජ ගර්හාවක් හා කොන් කිරීමේ ආකල්පයක් ඇති නොකිරීම සඳහාද ඒ සම්බන්ධයේදී වඩාත් ශිෂ්ට සම්පන්න භාෂාවක අවශ්‍ය වේ.

කෙසේ නමුත් ඇතැම් මාධ්‍ය ඒ සම්බන්ධයෙන් සවිඥාණිකද යන්න ගැටළුවකි. ඊට උදාහරණයක් ලෙසින් "කොරෝනා රියදුරා" යනුවෙන් අරුණ පුවත්පතේ (02/02) සිරස්තලය තුළ දැක්වෙන හැඳින්වීම පෙන්වා දිය හැක.

යම් පුද්ගලයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එසේ නම් මෙවැනි හැඳින්වීම් කෙතරම් සදාචාරාත්මක යැයි ඔබ සිතන්නේද? මෙවැනි හැඳින්වීම් ඔස්සේ පුද්ගල ගෞරවයට හානි නොවන්නේද?

#Covid19 #MediaEthicsSL #lka #SinhalaPress #Aruna